# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HO/09/CBO/ව්‍යාපෘති | ............................................ | 2021.04.0 7 |

දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්/ ප්‍රාදේශිය ලේකම්වරුන්,

දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන්,

සමෘද්ධි කළමනාකරුවන් ( ප්‍රාදේශිය/ බැංකු සමිති/ ව්‍යාපෘති/ බැංකු),

කලාප සහකාර කළමනාකරුවන්/ වසමේ (තුලාන්) භාර සමෘද්ධි සංවර්ධන නිලධාරින්,

සමෘද්ධි බැංකු සමිති හා බැංකු සභාපතිවරුන්,

සමෘද්ධි ප්‍රාදේශිය/ ප්‍රජාමූල සංවිධානවල සභාපතිවරුන්.

**<u>පොළොව මත සවි කරන කුඩා පරිමාණයේ සූර්යය ප්‍රකාශ වෝල්ත විදුලි බලාගාර සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන යටතේ ස්ථාපනය කිරිම.</u>**

උක්ත කරුණ සම්බන්ධව යොමු කළ සමාංක දරණ 2020.12.16, 2021.01.27, 2021.02.09 හා 2021.02.25 දිනැති ලිපි හා බැදේ.

2. "ගමට බලාගාරයක්" තේමාව යටතේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2021 මාර්තු 25 වන දින ප්‍රසිද්ධ පුවත්පත් දැන්විම් හා http://www.ceb.lk/tenders වෙබ් අඩවිය මඟින් සූර්යය ප්‍රකාශ වෝල්ත විදුලිය මිලදි ගැනිම සඳහා මිළ ගණන් කැඳවා ඇත.

3. මෙම මිල ගණන් කැදවිමට අදාළව යෝජනා ඉදිරිපත් කරනු ලබන "සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන" විසින් සමෘද්ධි බැංකුව/ බැංකු සමිතිය හා එක්ව පහත සදහන් අවශ්‍යතාවයන් සපුරාගත යුතුවේ.

(I) ව්‍යාපෘතියේ සැලසුම් සම්පාදනය, මූල්‍ය කටයුතු, මිලදි ගැනිම්, ඉදි කිරිම්, මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදු කිරිම.

(II) ව්‍යාපෘතියේ අවශ්‍යතාවය පරිදි අවශ්‍ය ඉඩම් මිලදි ගැනිම හෝ කල්බදු ක්‍රමයට ලබා ගැනිම. (පෞද්ගලික ඉඩම් පමණක් විය යුතු අතර ඉඩම හෝ ඉඩමේ කොටසක පිහිටිම අනිවාර්යයෙන්ම අදාළ තාරා පැවියේ (ට්‍රාන්ස්ෆෝමරයේ) සිට මීටර් 400ක් අහස් දුරින් පිහිටා තිබිය යුතුයි.)


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramul

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887 |

(III) විදුලි බලාගාරය ඉදි කිරීම හා අදාළ තාරා පැවියේ (ට්‍රාන්ස්ෆෝමරය) වෙත විදුලි මාර්ග (රැහැන්) ඉදි කිරීම, විදුලි ආරක්ෂණ පද්ධති සවි කිරීම, විදුලි මනු සහ අදාළ දුරස්ථ පාලන උපකරණ සවි කිරීම.

(IV) ව්‍යාපෘතියට අදාළ වන සියළු පාරිසරික අනුමැතීන්, රාජ්‍ය ආයතනවල අනුමැතිය හා ව්‍යවස්ථාපිත බලපත්‍ර ආදිය ලබා ගැනීම.

(V) සූර්යය ප්‍රකාශ වෝල්ත විදුලි බලාගාරය සඳහා ලංකා විදුලි බල මණ්ඩලය සමග බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමක් අත්සන් කළ යුතු අතර, විදුලිය මිලදී ගැනීම සඳහා එම ගිවිසුම වාණිජ මෙහෙයුම් ආරම්භ කරන දිනයේ සිට වසර 20ක කාලයක් සඳහා වලංගු වේ. අදාල තාරා පැවියට (ට්‍රාන්ස්ෆෝමරයට) මුදා හරින ශක්ති ප්‍රමාණය මත පමණක් පදනම්ව විදුලි මිලදී ගැනීම සිදු කෙරේ.

4. ඉහත ඡේද අංක 3(II) හි සඳහන් අවශ්‍යතාවය සපුරාලීම සඳහා පළමුවෙන්ම විදුලි මිළ ගණන් යෝජනා ඉදිරිපත් කළ යුතු " සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන " තෝරා ගත යුතුවේ. ඒ සඳහා දැනටමත් තෝරා ගෙන ඇති ඉඩම් හෝ තෝරා ගැනීමට අපේක්ෂිත ඉඩම් අතුරින් <u>ඇමුණුම 01 හි සඳහන් ස්ථාන තුළ පිහිටි සුදුසුම ඉඩම තෝරා ගෙන ඇමුණුම 02 හි සඳහන් ආකෘති පත්‍රයට අනුව සම්පූර්ණ කර 2021.04.25 දිනට ප්‍රථම samurdhi.cbo@yahoo.com හා mfdyear2018@gmail.com විද්‍යුත් ලිපිනවලට යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.</u>

5. ඉහත ඡේද අංක 04 අනුව කටයුතු කිරීම සඳහා ඇමුණුම 01 හි සඳහන් වන පරිදි පහත දක්වා ඇති ස්ථාන තුළ පිහිටි සුදුසුම ඉඩම තෝරා ගත යුතු අතර එම ඉඩම අයත් වන "සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය" විසින් වෙන් වෙන් වශයෙන් "යෝජනා කැඳවීම් ලේඛන" (Request for Proposal Document – RFP) සම්පූර්ණ කර සමෘද්ධි ප්‍රජාමූල බැංකු හෝ බැංකු සමිතියේ අනුමැතිය මත 2021 මැයි 24 දිනට ප්‍රථම ඇමුණුම 01 හි සඳහන් පරිදි, පළාත් භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් වෙත භාර දිය යුතු වන බවද සැලකුව මැනවි.

## <u>ඇමුණුම 01 හි ස්ථාන සංඛ්‍යාව දක්වා ඇති ආකාරය</u>

| අනු අංක | බෙදා හැරීම් අංශ | බෙදා හැරීම් පළාත | ප්‍රදේශය | ස්ථාන සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | 01 | උතුරු පළාත | යාපනය | 20 |
| 2 | | | කිළිනොච්චි | 20 |
| 3 | | | වවුනියා | 20 |
| 4 | | උතුරු මැද පළාත | අනුරාධපුර | 20 |
| 5 | | | කැකිරාව | 20 |
| 6 | | | මින්නේරිය | 20 |
| 7 | | වයඹ පළාත 1 | හලාවත | 20 |
| 8 | | | කුලියාපිටිය | 20 |
| 9 | | | පුත්තලම | 20 |

| | | | | |
|---|---|---|---|---|
| 10 | | | වෙන්නප්පුව | 20 |
| 11 | | වයඹ පළාත 11 | කුරුණෑගල | 20 |
| 12 | | | මහව | 20 |
| 13 | | | වාරියපොළ | 20 |
| 14 | | | නාරම්මල | 20 |
| 15 | 02 | මධ්‍යම පළාත 1 | දඹුල්ල | 20 |
| 16 | | | ගලගෙදර | 20 |
| 17 | | | කුන්ඩසාලේ | 20 |
| 18 | | මධ්‍යම පළාත 11 | මාවනැල්ල | 20 |
| 19 | | | පේරාදෙණිය | 20 |
| 20 | | නැගෙනහිර පළාත | අම්පාර | 20 |
| 21 | | | මඩකලපුව | 20 |
| 22 | | | ත්‍රිකුණාමලය | 20 |
| 23 | | බස්නාහිර පළාත උතුර | දිවුලපිටිය | 20 |
| 24 | | | වේයන්ගොඩ | 20 |
| 25 | 03 | සබරගමුව පළාත | ඇහැලියගොඩ | 20 |
| 26 | | | කහවත්ත | 20 |
| 27 | | | ඇඹිලිපිටිය | 20 |
| 28 | | | රුවන්වැල්ල | 20 |
| 29 | | ඌව පළාත | දියතලාව | 20 |
| 30 | | | මොණරාගල | 20 |
| 31 | | | මහියංගණය | 20 |
| 32 | | බස්නාහිර පළාත දකුණ 11 | අවිස්සාවේල්ල | 20 |
| 33 | | | බණ්ඩාරගම | 20 |
| 34 | 04 | දකුණ පළාත 1 | අකුරැස්ස | 20 |
| 35 | | | බද්දේගම | 20 |
| 36 | | | අම්බලන්ගොඩ | 20 |
| 37 | | | ගාල්ල | 20 |
| 38 | | දකුණ පළාත 11 | හම්බන්තොට | 20 |
| 39 | | | තංගල්ල | 20 |
| 40 | | | මාතර | 20 |
| 41 | | බස්නාහිර පළාත දකුණ 1 | කළුතර | 20 |
| 42 | | | මතුගම | 20 |
| | | | | **840** |

6. මෙම ලිපිය මගින් හුදෙක්ම බලාපොරෝත්තු වන්නේ අදාළ පුවත්පත් දැන්වීම අනුව විදුලි බලාගාර ඉදිකිරිමට යෝජිත ට්‍රාන්ස්ෆෝමරය අනුව සුදුසුම ඉඩම් හඳුනා ගැනිම වේ. එසේම මෙම ඉඩම මිලදී ගැනිම හෝ දීර්ඝ කාලීන බදු පදනමට ලබා ගන්නේ නම් ඒ සඳහා වන දල වියදමද හඳුනා ගැනිම අවශ්‍ය වේ.

7. සුදුසුම ඉඩම තෝරා ගත් පසු ඒ සඳහා වන වියදම් සලකා බලා ව්‍යාපෘතියේ සැලසුම් සම්පාදනය, මූල්‍ය කටයුතු, ඉදි කිරිම්, මෙහෙයුම් කටයුතු, නඩත්තු කටයුතු හා “යෝජනා කැඳවීම් ලේඛන (RFP)” ඉදිරිපත් කරන ආකාරය පිළිබඳව දැනුවත් කිරිමක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අදාළ නිලධාරින් වෙත ලබා දෙනු ඇත.

8. මේ පිළිබඳ වැඩිදුර විස්තර සඳහා ප්‍රජාමූල අංශයේ අධ්‍යක්ෂ පි.ආර්.ඩි.එච්. අනුරවංශ මහතා (දූරකථන අංක 071 4118226) හා ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ ජ්‍යෝෂ්ඨ කළමනාකරු ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා (දූරකථන අංක 0777 920217) අමතන ලෙස කාරුණිකව දන්වමි.

ආර්.පි.බි. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :

1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික ,ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය } - කා.දැ.ස
2. ප්‍රධාන විගණාධිපති
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
4. අධ්‍යක්ෂ - ක්ෂුද්‍ර මූල්‍ය
5. අධ්‍යක්ෂ - ප්‍රජාමූල සංවිධාන

(2–5) } - අ.ක.ස.